සියලු ම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

අධ්‍යාපන කලාපය - මතුගම
EducOatiobal Zonel - Mathugama

දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය

දේශපාලන විද්‍යාව I

23 S I

කාලය පැය දෙකයි

* මෙම පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.

* එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

❖ අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි හෝ ගැලපෙන පිළිතුර තෝරන්න.

01) දේශපාලනය,
- (1) ග්‍රීක යුගයෙන් පසු ආරම්භ විය.
- (2) රාජ්‍යයට පමණක් සීමා වේ.
- (3) රාජ්‍ය, ආණ්ඩුව හා රාජ්‍ය පරිපාලනය ඇතුළු සමාජයේ පුරවැසියන් අතර පවත්නා භාවිතයකි.
- (4) සමාජීය විද්‍යාවන්ට මැතකදී එකතු වූ සංකල්පයකි.
- (5) රටක පාලකයින් බැහැරව සිටින ක්‍රියාවලියකි. (……….)

02) දේශපාලන විද්‍යාව,
- (1) පෙරදිග විෂයකි.
- (2) ස්ථිතික වේ.
- (3) ප්‍රවේශය , න්‍යාය හා විධික්‍රම වශයෙන් බහුවිධ වේ.
- (4) නව යුගයෙන් පසු බිහිවිය.
- (5) රාජ්‍ය සංකල්පයෙන් පරිබාහිරව බිහිවී ඇත. (……….)

03) දේශපාලන විද්‍යාවේ චර්යාවාදී ප්‍රවේශය,
- (1) නව මාක්ස්වාදීන් විසින් ඉදිරිපත් කරන ලදී.
- (2) ප්‍රතිමානයන් මත ගොඩනැගී ඇත.
- (3) 1970 දශකයේදී ඉතා ජනප්‍රිය අධ්‍යයන ප්‍රවේශයක් බවට පත් විය.
- (4) පැරණි අධ්‍යයන ප්‍රවේශයකි.
- (5) 1920 දශකයේ ආරම්භ වී 1940 - 60 දශකවල එහි අධිපති ධාරාව බවට පත් විය.

(……….)

04) දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
(1) චර්යාවාදයට අනන්‍ය වූ ප්‍රවේශයකි.
(2) සමාජයේ ආර්ථික පදනම උපරි ව්‍යුහයේ පැවැත්ම තීරණය වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරයි.
(3) දේශපාලනය සඳහා ආර්ථික හා පන්තිය යන සාධක බල නොපාන බව මින් පවසයි.
(4) ග්‍රීක යුගයේ පටන් භාවිතා වන ප්‍රවේශයකි.
(5) දේශපාලන ප්‍රපංචයන් ගැටලුවක් හෝ තේමාවක් අවස්ථා කිහිපයක් සමඟ සන්සන්දනය කරමින් අධ්‍යයනය කිරීම මින් හැඟ වේ. (……….)

05) දේශපාලන මතවාද,
(1) මිනිසුන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය දේශපාලන මතවාදයන්ගෙන් වියුක්තව පවතී.
(2) දේශපාලන මතවාද ගණනාවක් ම පවතින අතර ඒවා එකිනෙකට අසංගත වේ.
(3) දේශපාලන දෘෂ්ටිවාද යන පර්යාය පදය ද මේ සඳහා භාවිතා කරයි.
(4) දේශපාලන මතවාද මගින් සමාජයේ දේශපාලනයට සිදුවන බලපෑම අවම වන බව අදහසයි.
(5) දේශපාලන මතවාදයන්ට පුද්ගලයින්ගේ දේශපාලන විඥානය කෙරෙහි බලපෑම් කළ නොහැක.
(……….)

06) දේශපාලන මතවාදයක් වන සමූහාණ්ඩුවාදය,
(1) ලිබරල් වාදයට සංගත වූ අදහස්වලින් යුක්ත වේ.
(2) දේශපාලන විද්‍යාවට මෑතකදී එකතු වුණ දේශපාලන මතවාදයකි.
(3) දේශපාලන බලයේ හිමිකරුවා රාජ්‍ය යන අදහස මුල් කර ගනිමින් බිහිවී ඇත.
(4) රාජාණ්ඩුවාදය හා අනන්‍ය වූ දේශපාලන මතවාදයකි.
(5) මිනිස් නිදහස අයිතිවාසිකම් යටපත් කිරීම සඳහා ඉදිරිපත් වූ මතවාදයකි. (……….)

07) දේශපාලන පක්ෂ,
(1) විප්ලවකාරී පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩු බලය දිනා ගැනීමට උත්සාහ කරයි.
(2) ගුණාත්මක තත්ත්වය මත ද්වි පක්ෂ, බහු පක්ෂ , ඒක පක්ෂ වශයෙන් වර්ග කරයි.
(3) සමාජ බලය අධිකාරී බලය බවට පත් කිරීමට උත්සාහ දරයි.
(4) දේශපාලන කණ්ඩායම් හා සමාජ ව්‍යාපාර සමඟ සමාන වේ.
(5) සමාජවාදීන්ට අනුව සංවිධානය කරන ලද මහජන මතය දේශපාලන පක්ෂ වේ. (……….)

08) රාජ්‍යය යනු,
(1) ස්වේච්ඡා සංවිධාන හා සමාන වූවකි.
(2) 16 වන සියවසෙන් පසු බිහි වූවකි.
(3) ගෝලීයකරණය මගින් ශක්තිමත් වී ඇති දේශපාලන සංස්ථාවකි.
(4) පටු අරමුණකින් යුතු සංස්ථාවයි.
(5) සමාජයක් පාලනය කිරීම සඳහා නිර්මාණය වූ බල ව්‍යුහයේ හා ආයතනවල එකතුව වේ.
(……….)

09) රාජාණ්ඩු පාලනය තුළ,
(1) ''පුරවැසිභාවය'' ඉස්මතු කරන ලදී.
(2) දෘඪ වූ භූමියක් දක්නට ලැබිණි.
(3) දේවවරම්වාදය ව්‍යාප්ත විය.
(4) බලතල බෙදීම ක්‍රියාත්මක විය.
(5) අයිතිවාසිකම් හා යුතුකම් සහිත සාමාජිකයන්ගෙන් යුතු පාලන ක්‍රමයක් විය. (……….)

10) පුරවැසියා යනු,

(1) විදේශිකයින් යන නාමය සමපාත වේ.
(2) වගකීම් පමණක් භුක්ති විඳින්නා වේ.
(3) ඇතැම් තනතුරු හා ඡන්ද බලය භුක්ති විඳීමේ එකම නිර්ණායකය වේ.
(4) නූතන රාජ්‍ය තුළ ඍජු ලෙස පාලන කාර්යයන්ට සම්බන්ධ වේ.
(5) රාජ්‍යයේ කාර්යභාරයට සක්‍රිය ලෙස සහභාගී වන්නා බව සැලකේ. (……….)

11) ලිබරල් වාදය,

(1) ධනේශ්වර ක්‍රමය පෙරළා දැමීම සඳහා ඉදිරිපත් වූ අදහස් මාලාවකි.
(2) කාර්මික ධනවාදී ආර්ථික ක්‍රමයේ දේශපාලනමය ප්‍රකාශනය වේ.
(3) රාජ්‍ය පන්ති උපකරණයක් බව අවධාරණය කරයි.
(4) සංශෝධිත ලිබරල්වාදය මගින් රාජ්‍ය වෙළඳපල කටයුතුවලින් ඈත්විය යුතු බව අවධාරණය කරයි.
(5) රාජ්‍ය සර්ව බලධාරී ආයතනයක් ලෙස සලකයි. (……….)

12) කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

(1) ඇමරිකා එක්සත් ජනපදය තුළින් හඳුන්වා දෙන ලදී.
(2) ව්‍යවස්ථාදායකය හා විධායකය වෙන් වෙන්ව තෝරා ගනී.
(3) වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය ලෙස පොදුවේ පිළිගනී.
(4) ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ නිල කාලය සම්බන්ධයෙන් එකිනෙකාට බලපෑම් කළ නොහැකි පරිදි පිහිටුවා ඇත.
(5) රාජ්‍ය නායකයා හා ආණ්ඩුවේ නායකයා යන තනතුරු දෙක අතර පැහැදිලි වෙනස්කමක් දක්නට ලැබේ. (……….)

13) ජනාධිපති ආණ්ඩුක්‍රමය,

(1) විධායකය ව්‍යවස්ථාදායකය තුළින් තෝරා ගනී.
(2) විශ්වාසභංගයක් මගින් ජනාධිපති ඉවත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකය සතු වේ.
(3) ව්‍යවස්ථාදායකය විසිරුවා හැරීමේ බලය විධායකය භුක්ති විඳී.
(4) ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා , ආණ්ඩුවේ නායකයා , සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා යන සියළු බලතල අත්පත් කර ගනී.
(5) ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව තුළින් හඳුනා ගත හැක. (……….)

14) සන්ධීය ආණ්ඩු ක්‍රමය

(1) මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය සහිත ආණ්ඩු ක්‍රමයකි.
(2) සාපේක්ෂ වශයෙන් අනම්‍ය වූ ව්‍යවස්ථාවක් සහිත ආණ්ඩු ක්‍රමයකි.
(3) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යස්ථාදායකය ඒක මාණ්ඩලිකව පවතී
(4) සමාජීය වශයෙන් බෙදී ගිය විශාල රාජ්‍යයන්ට වඩාත් යෝග්‍ය වේ.
(5) මධ්‍ය හා පරිධිය අතර මධ්‍යම ආණ්ඩුවේ පනතක් මගින් බලය බෙදා ඇත. (……….)

15) මාක්ස්වාදයට අනුව,

(1) සමාජ ප්‍රතිසංස්කරණයන් හරහා සමාජවාදී සමාජයක් උදා කළ හැක.

(2) සුභසාධනය සඳහා රාජ්‍යයේ පැවැත්ම අත්‍යවශ්‍ය වේ.

(3) ධනවාදයේ දේශපාලන මතවාදය ලෙස ඉදිරිපත් විය.

(4) සමාජයේ උපරි ව්‍යුහය අන්තර් ව්‍යුහයේ පදනම මත තීරණය වන අතර අන්තර් ව්‍යුහය පරිවර්තනය කිරීමෙන් උපරි ව්‍යුහය ද පරිවර්තනය කළ හැක.

(5) පෞද්ගලික දේපල ක්‍රමය තුළින් මතු කර ඇති ආර්ථික හා සමාජ අසමානතා දුරු කිරීම සඳහා රාජ්‍ය මැදිහත් විය යුතු බව අවධාරණය කරයි. (……….)

16) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය,

(1) ලිබරල්වාදයේ ගුණාංග සහිතව ඉදිරිපත් කර ඇත.

(2) ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ එඩ්වර්ඩ් බර්න්ස්ටයින් ගේ අදහස් මත ඉදිරිපත් විය.

(3) විප්ලවීය පරිවර්තනය හරහා සමාජවාදය බිහිකළ යුතු බව පිළිගනී.

(4) රාජ්‍ය නිර්බාධවාදය ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරයි.

(5) මුළුමනින්ම මාක්ස්වාදය හා අනන්‍ය වේ. (……….)

17) ගැටුම් කළමනාකරණය යනු,

(1) එක් පාර්ශවයකට ජය ලැබෙන පරිදි ගැටුම විසඳා ගැනීම වේ.

(2) ගැටුමට හේතු වූ සාධකයන්ට විසඳුම් සෙවීමේ ක්‍රියාවලියයි.

(3) ගැටුමට සම්බන්ධ පාර්ශව අතර සබඳතා වෙනස් කිරීම වේ.

(4) ගැටුමක් මුළුමනින්ම අවසන් කිරීම වේ.

(5) ගැටුමේ ප්‍රචණ්ඩබව හා විනාශ කාරී බව පාලනය කරමින් එහි ව්‍යාප්තිය හා තීව්‍රතාවය සීමා කිරීම වේ. (……….)

18) නීතියේ ආධිපත්‍ය යනු,

(1) රටක නීති ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක වීමයි.

(2) අතීතයට බලපාන ලෙස නීති පැනවීමට ව්‍යවස්ථාදායකයට බලය හිමි වීමයි.

(3) A.V ඩයිසි විසින් 1885 දි සංවිධානාත්මකව ඉදිරිපත් කළ නමුත් ග්‍රීක යුගයේ පටන් දක්නට ලැබෙන දේශපාලන න්‍යායකි.

(4) පාලිතයන් නීතියට යටත් විය යුතු බවත් පාලකයින් නීතියට ඉහළින් සිටිය යුතු බවත් ය.

(5) ව්‍යවස්ථානුකූල පාලනයක මෙන්ම ආඥාදායක පාලන ක්‍රමයකදී දක්නට ලැබෙන න්‍යායක (……….)

19) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් අදාළ වන යෝග්‍යතම ප්‍රකාශය වන්නේ,

(1) බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව මුළුමනින්ම ලියැවුණු ලියවිල්ලකි.

(2) බ්‍රිතාන්‍ය තුළ පවතින්නේ අධිපති ද්වී පක්ෂ ක්‍රමයකි.

(3) බ්‍රිතාන්‍ය විධායකය ව්‍යවස්ථාදායකයට මුළුමනින්ම පරිබාහිරව තේරී පත් වේ.

(4) බ්‍රිතාන්‍යය යනු එංගලන්තය, වේල්සය, උතුරු අයර්ලන්තය හා ස්කොට්ලන්තයෙන් සමන්විත සංධීය රාජ්‍යයකි.

(5) බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාවෙන් සම්ප්‍රදායන් ඉවත් කළ හොත් එය ලේ මස් නහර නැති ඇටසැකිල්ලක් බඳුය. (……….)

20) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය,

(1) කේඩර පක්ෂවලින් පමණක් සමන්විත වේ.
(2) අධිපති ද්විපක්ෂ ක්‍රමයකින් යුතු බහු පක්ෂ ක්‍රමයක් දක්නට ලැබේ.
(3) ප්‍රධාන පක්ෂ දෙකට තනිව ආණ්ඩු බලය මෙහෙයවීමේ හැකියාව සහිත පක්ෂ ක්‍රමයකි.
(4) බහු පක්ෂ ක්‍රමයක් ලෙස හඳුනා ගත හැක.
(5) පශ්චාත් යටත් විජිත සමයේදී ආරම්භ වී වර්ධනය වී ඇත. (……….)

❖ **අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21) රාජ්‍ය ප්‍රතිපත්ති,

A - පෞද්ගලික අංශයේ ප්‍රතිපත්ති සමඟ සමපාත වේ.
B - දේශපාලන පද්ධතියක සිටින අධිකාරීන් විසින් නිර්මාණය කරමින් ක්‍රියාවට නංවනු ලැබේ.
C - ආණ්ඩුව කරන්නේ කුමක්ද? ඒවා ඉටු කරන්නේ ඇයි? යන්න තීරණය කිරීම වේ.
D - ඇමරිකානු සමාජ විද්‍යාඥයින් විසින් වර්ධනය කර ඇත.
E - රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ නිසි බලධාරියා වන්නේ අධිකරණයයි.

(1) ABC (2) ABD (3) BCD
(4) ABCD (5) BCDE (……….)

22) ජාත්‍යන්තර දේශපාලනය

A - ත්‍රස්තවාදය වර්ධනය කිරීම සඳහා උදව් කරනු ලැබේ.
B - ජාතීන්ගේ බාහිර සබඳතාවයන් වේ.
C - ඇති විය හැකි අරාජික හා අනාරක්ෂිත බව දුරු කර ගැනීමේ අරමුණින් වර්ධනය කර ඇත.
D - ගෝලීයකරණය නිසා නව මුහුණුවරක් ගෙන ඇත.
E - ජාතික රාජ්‍ය, අන්තර්ජාතික සංවිධානය, රාජ්‍ය නොවන සංවිධානය, බහු ජාතික සමාගම් ඇතැම් කීර්තිමත් පුද්ගලයින් යනාදියෙන් සමන්විත සමස්තයයි.

(1) ABC (2) ABD (3) BCD
(4) ABCD (5) BCDE (……….)

23) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් සිදු කළ වෙනස්කම් වන්නේ,

A - රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම හරහා නිර්බාධවාදී ප්‍රතිපත්තිය හඳුන්වා දීම.
B - ඉංග්‍රීසි අධ්‍යාපනය හඳුන්වා දීම හරහා බටහිර ගැති දේශීය මධ්‍යම පන්තියක් බිහි කිරීම.
C - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හරහා විදේශීය ප්‍රාග්ධනය මෙරටට ගෙන්වීම.
D - ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල ආණ්ඩු කරු වටා ඒකරාශී කිරීම මගින් අත්තනෝමතික පාලන ක්‍රමයක් බිහි කිරීම.
E - නිල නොලත් බහුතරය සහිත ව්‍යාවස්ථාදායකයක් හඳුන්වා දීම.

(1) ABC (2) ABD (3) BCD
(4) ABCD (5) BCDE (……….)

24) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ,

A - ව්‍යවස්ථානුකූල රාජාණ්ඩු ක්‍රමය

B - වෙස්ට් මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය අනුගමනය කිරීම.

C - රාජාධිකරණය මුල් තැනගත් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම.

D - පුරවැසියන්ට මූලික අයිතිවාසිකම් ප්‍රදානය කිරීම

E - රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ ස්වාධීනත්වය වෙනුවෙන් විශේෂ පියවර ගැනීම.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය.
(4) A B C හා E ය. (5) B C D හා E ය. (……….)

25) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාධිකරණය,

A - 1972 නවාංගයකි.

B - අධිකරණ පූර්ව විවරණ බලය පමණක් භුක්ති විඳිනු ලැබීය.

C - සාමාජිකයන් 10 ක ගෙන් සමන්විත විය.

D - සෑම නඩු විභාගයක්ම අප්‍රසිද්ධියේ පැවැත්විය යුතුය.

E - සාමාන්‍ය කෙටුම්පත් පිළිබඳ පැය 24 ක් ඇතුළත තීන්දුව ලබා දිය යුතුය.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය.
(4) A B C හා E ය. (5) B C D හා E ය. (……….)

❖ **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත I වගුව සඳහා යොමුවෙහි සඳහන් 1,2,3,4 සහ 5 යන වරණ වලින් සුදුසු වරණය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

**I වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

**I වගුව**

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 26. | 1972 ව්‍යවස්ථාව මගින් මහජන නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත ජාතික රාජ්‍ය සභාවක් පිහිටුවන ලදී. | ජාතික රාජ්‍ය සභාව ගොඩනගා තිබූයේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය වාදය පදනම් කරගෙනය. (……….) |
| 27. | 1978 ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය 17 වන සංශෝධනය මගින් ගෙන එය ලද ප්‍රජාතන්ත්‍රවාදී පියවර ආපසු හැරවීමකි. | 1978 ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූරකාලය අවුරුදු 05 දක්වා අඩු කරන ලදී. (……….) |
| 28. | 1978 ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයට අනුව මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජනාධිපතිට එරෙහිව නඩු පැවරිය හැක. | 19 වන සංශෝධනයට අනුව අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. (……….) |
| 29. | ලංකාවේ විදේශ ප්‍රතිපත්ති 2015 න් පසු ඉන්දීය ප්‍රමුඛත්වය සහිත විදේශ ප්‍රතිපත්තියකි. | 2015 න් පසු ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තුළ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවය අඩු වී ඇත. (……….) |
| 30. | ලංකාවේ 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු මැතිවරණයක් මගින් ජනාධිපති තෝරා ගනී. | 1978 ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ 2/3 බහුතරයෙන් මුළුමනින්ම සංශෝධනය කළ හැක. (……….) |

## B කොටස

31. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස සලකා බැලීමේදී හඳුනා ගත හැකි මූලික අර්ථ දෙකකි. එම අර්ථ දෙක නම් කරන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

32. දේශපාලන විද්‍යාව බටහිර විෂයකි. නමුත් පෙරදිග වශයෙන්ද දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය අදහස් හඳුනාගත හැක. පුරාතන ඉන්දියාවේ හා චීනයේ එලෙස දේශපාලනය පිළිබඳව ශාස්ත්‍රීය අධ්‍යයනය කළ පෙරදිග චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

33. තුළනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ මූලික ප්‍රවේශ ධාරා තුනකි. ඉන් දෙකක් ලියන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

34. මාක්ස්වාදයට අනුව සමාජයේ සැකැස්ම මූලික තල දෙකකින් සමන්විත වේ. එම තල දෙක නම් කරන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

35. දේශපාලන න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකක් පවතී. එම අර්ථ දෙක නම් කරන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

36. පහත දැක්වෙන ලක්ෂණවලට අදාළ දේශපාලන පක්ෂ වර්ග දෙක පිළිවෙලින් නම් කරන්න.

(i) පක්ෂයේ ගුණාත්මකභාවය මත වර්ග කර ඇති මෙම පක්ෂ වර්ගය දේශපාලනයේ ක්‍රියාකාරී ප්‍රභූන් විසින් ගොඩ නගා ඇති සමාජයේ එක්තරා සීමිත කොටසක් නියෝජනය කිරිම වෙනුවෙන් බිහි වූ පක්ෂ වේ.

……………………………………………………………………………………

(ii) මැතිවරණයකදී බහුතර ආසන ප්‍රමාණයක් දිනාගත නොහැකි නමුත් මැතිවරණවලදී ජනතාවගේ දේශපාලන තීරණ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කළ හැකි පක්ෂ වේ.

……………………………………………………………………………………

37. සිවිල් සමාජය යන්නට ප්‍රධාන අර්ථකථන 04 ක් ඉදිරිපත් වී ඇත. ඉන් දෙකක් ලියන්න.

(i) ……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

38. පහත දැක්වෙන ලක්ෂණවලට අදාළ සංකල්ප දෙක හඳුනාගෙන නම් කරන්න.

(i) පූර්ව නූතන රාජ්‍යයේ රාජ්‍යයක සාමාජිකයා මෙලෙස හඳුන්වන අතර ඔහුට අයිතිවාසිකම් කිසිවක් හිමි නොවූ අතර ඔහු රාජ්‍ය වෙනුවෙන් වගකීම් පමණක් ඉටු කිරීමට බැඳී සිටී.

.....................................................................................................

(ii) ජාතික රාජ්‍ය තුළ රාජ්‍ය සාමාජිකයා මේ නමින් හඳුන්වන අතර ඔහු රාජ්‍යයට යුතුකම් හා වගකීම් ඉටු කරන අතර ඒ වෙනුවෙන් ඔහුට රාජ්‍ය විසින් අයිතිවාසිකම් හිමිකර දෙනු ලැබේ.

.....................................................................................................

39. කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ 2 ක් ලියන්න.

(i) .....................................................................................................

(ii) .....................................................................................................

40. සන්ධීය ආණ්ඩු ක්‍රමයක අත්‍යවශ්‍ය මූලික ලක්ෂණ 02 ක් ලියන්න.

(i) .....................................................................................................

(ii) .....................................................................................................

41. (i) ලංකාවේ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රමය කුමක්ද?

.....................................................................................................

(ii) ලංකාවේ වාර්ගික නියෝජනය මුළුමනින්ම අහෝසි කළ ආණ්ඩු ක්‍රමය කුමක්ද?

.....................................................................................................

42. සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් සුළු ජාතීන්ගේ ආරක්ෂණය සඳහා ගනු ලැබූ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(i) .....................................................................................................

(ii) .....................................................................................................

43. (i) 1972 ව්‍යවස්ථා යටතේ පිහිට වූ නවාංගයක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාධිකරණයේ සාමාජිකයන් ගණන කීයද?

.....................................................................................................

(ii) 1972 ව්‍යවස්ථාධිකරණයට ඉදිරිපත් විය හැකි පෙත්සම් වර්ග දෙක කුමක්ද?

.....................................................................................................

44. පහත දේශපාලන න්‍යායන් දෙක ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනා නම් කරන්න.

(i) නීතියේ ආධිපත්‍යය .....................................................................

(ii) බලතල බෙදීමේ න්‍යාය .....................................................................

45. ව්‍යවස්ථාදායකයක් සංවිධානය විය හැකි මූලික ක්‍රම දෙකකි. එම ක්‍රම දෙක නම් කරන්න.

(i) .....................................................................................................

(ii) .....................................................................................................

46. 1978 ව්‍යවස්ථාව තුළ පළාත් සභා හඳුන්වා දීම හා ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර හඳුන්වාදීම සිදු කළ ව්‍යවස්ථා සංශෝධන දෙක නම් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

47. 1978 ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව,

(i) ජනාධිපති අපේක්ෂකයෙකු වීමට අවශ්‍ය වයස් සීමාව කීයද? ..............................

(ii) ජනාධිපතිවරයෙකු වශයෙන් පත් වූ තැනැත්තෙකුට එසේ පත්විය හැකි වාර ගණන කීයද?

.................................

48. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය අධිපති ද්වී පක්ෂ ක්‍රමයක් ලෙස සැලකේ. එම අධිපති පක්ෂ දෙක නම් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

49. ලංකාව සාමාජිකයින් වන පහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන දෙක හඳුනා ගන්න.

(i) 1985 දී ආරම්භ කළ මෙය දකුණු ආසියාතික රටවල් 8 ක් සාමාජිකත්වය දරන අතර අළුතින්ම එක් වූ අටවන සාමාජිකයා ඇෆ්ගනිස්ථානයයි.

..............................................................................................

(ii) ජාත්‍යන්තර සමුළුවක් වන මෙය දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ඇති වූ කඳවුරු වාදයට මැදි වූ පශ්චාත් යටත් විජිත රාජ්‍යය එකතු වී 1961 දී පිහිටුවාගත් අතර ලංකාව ද එය ආරම්භක සාමාජිකයෙකු වේ.

..............................................................................................

50. දේශපාලන පක්ෂ බිහි වීම කෙරෙහි බලපෑ ප්‍රකාශ සාධක දෙකකි. එම සාධක දෙක ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................